# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1829/27 - 2013 සැප්තැම්බර් මස 24 වැනි අඟහරුවාදා - 2013.09.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වන වගන්තිය යටතේ මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

නිසි අධිකරණ බලය ඇති අධිකරණයක ආඥාවක් අනුව සභාපතිට ධූරය දැරීම අවසන් වීම හේතු කොට ගෙන මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ, සභාපති වන කෝරලේ ගෙදර පියතිස්ස නම් වූ සභාපති අයත් වන්නාවූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් නිශ්චිත කාල පරිච්ඡේදය ඇතුළත ස්වකීය තීරණය දැනුම් නොදී ඇති හෙයින් ද ;

මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී ගමලත්ගේ දිලිප් නිශාන්ත වන මම, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, 2011 මාර්තු මස 17 වැනි දින මාවනැල්ල ප්‍රාදේශීය සභාව සඳහා පැවැත්වූ ඡන්ද විමසීමේ දී ඊළඟට වැඩිම මනාප සංඛ්‍යාව ලබාගත් පී. පී. වික්‍රමසිංහ මහතා ඒ පුරප්පාඩුව ඇති වූ මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ගමලත්ගේ දිලිප් නිශාන්ත,
තේරීම්භාර නිලධාරී,
මාවනැල්ල ප්‍රාදේශීය සභාව.

2013 සැප්තැම්බර් මස 23 වන දින,
මැතිවරණ කාර්යාලය,
කෑගල්ල.

1A - G 18313— 165 (2013/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*